සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම :- ..................................................  විභාග අංකය :- ..........................

I කොටස

- 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.

(01) පිඟාන, දාදුකැටය, බෝලය හා වළල්ල යන උපකරණ අතරින් වෘත්තාකාර හැඩ ඇඳීම සඳහා භාවිතා කල හැකි ද්‍රව්‍යය දෙකක් නම් කරන්න.


(i) ..........................................................

(ii) ..........................................................

(02) මෙම වර්ෂයේ අප්‍රේල් මස පළමු දිනය අන්තර්ජාතික සම්මත ආකාරයට ලියා දක්වන්න.

(03) 2kg 25g ක් ග්‍රෑම් වලින් දක්වන්න.

(04) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ පරිමිතිය $x$ ඇසුරෙන් ලියන්න.





(05) -3 ත් + 2 ත් අතර ඇති සියළු නිඛිල සංඛ්‍යා ලියා දක්වන්න.

(06) රූපයේ a හා b මඟින් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියන්න.

a. ..........................................................

b. ..........................................................




(07) 100 ඒවා 6 + 10 ඒවා 4 +1 ඒවා 1 + $\frac{1}{10}$ ඒවා 2 + $\frac{1}{100}$ ඒවා 5 ලෙස විහිදුවා ලියා ඇති සංඛ්‍යාව කුමක් ද?

(08) x = 10 වන විට පහත දී ඇති විජීය ප්‍රකාශන වල අගය සොයන්න.

(i) $x+3$ (ii) $x-8$

(09) රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියා එය සරල ම ආකාරයෙන් දක්වන්න.




To download past papers visit
www.vajirapani.blogspot.com

(10) 0. 2, 0. 22, 0. 02 යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

(11) ඇපල් ගෙඩි තුනක මිල රුපියල් 120 ක් නම් ඇපල් ගෙඩි හතක මිල සොයන්න.

(12) මේසයක් මත තබා ඇති සකාහයක් රූපයේ දක්වේ. එහි ඇති සිරස් දාර ගණන කීය ද?




(13) නිමල් පාසලට යාමට නිවසින් පිටත් වන්නේ පෙ.ව 6 පසුවී මිනිත්තු 40ට වේ. පාසලට යාමට ඔහුට ගතවන කාලය මිනිත්තු 28 ක් නම් ඔහු පාසලට ළඟා වන වේලාව සම්මත ආකාරයෙන් ලියන්න.

(14) (i) සවිධි චතුස්තලයකට ඇති මුහුණත් ගණන කීය ද?

(ii) සවිධි චතුස්තලයක මුහුණතක හැඩය අඳින්න.

(15) (i) මෙම රූපයේ පරිමිතිය සොයන්න.




(ii) එම තල රූපය හඳුන්වන නාමය කුමක් ද?

---

(16) පහත දී ඇති ප්‍රකාශ අතරින් අනුපාත වශයෙන් සැලකිය හැකි ප්‍රකාශ තෝරා යටින් ඉරි අඳින්න.

(i) චිත්ත මීටර 2ක මිල රුපියල් 100කි.

(ii) මගේ ස්කන්ධය නංගීගේ ස්කන්ධය මෙන් තුන් ගුණයකි.

(iii) රු.1000ක් බැංකුවක තැන්පත් කල පුද්ගලයකුට වසරකට ලැබෙන පොළිය රු.100 කි.

---

(17) හිස්තැන් සඳහා සුදුසු අගය ලියන්න.


(i) $52 \times 100$ = ..........................................

To download past papers visit
www.[illegible].blogspot.com

(ii) $7\,300 \div 10$ = ..........................................

---

(18) සංඛ්‍යා රේඛාව මත තිත් මගින් සලකුණු කර ඇති සංඛ්‍යා ඇසුරින් අසමානතා ලකුණු භාවිත කර සම්බන්ධතා 2ක් ලියන්න.




1. ....................................................... 2. .......................................................

---

(19) පන්තියක සිටින සිසුන් ගණන ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට 40ක් විය. එක් ළමයෙක් අස් වී ගිය පසු එම අගය දහයේ ගුණාකාරයට වැටයූ විට 30 නම් දැන් පන්තියේ සිටින ළමුන් ගණන කීයද ද?

---

(20) 0 , 2 , 3 හා 6 යන ඉලක්කම් හතර භාවිතා කරමින් 6 ඉලක්කමින් සියස්ථානය නිරූපණය වනසේ ලිවිය හැකි කුඩාම සංඛ්‍යාව කුමක් ද?

## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

(01) ඔබගේ ගුරුතුමා /ගුරුතුමියගේ මඟ පෙන්වීම යටතේ "දත්ත රැස් කිරීම හා නිරූපණය" යන පාඩමේ දී ඔබ විසින් කරන ලද නිරීක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ මතකයට නගා ගනිමින් පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(a) (i) නිරීක්ෂණය මඟින් තොරතුරු රැස් කිරීමට ඔබ ඇතුලු කණ්ඩායම් වලට පැවරුණු අවස්ථා 2ක් ලියා දක්වන්න.

(ii) තොරතුරු රැස් කිරීමේදී ඔබ ඇතුළු කණ්ඩායමට මුහුණ පෑමට සිදුවූ දුෂ්කරතා 2ක් ලියන්න.

(b) සිසුන් 30 ක් සිටින පන්තියක එක් සිසුන් කණ්ඩායමක් විසින් එක් එක් සිසුවාගේ පවුලේ සාමාජිකයන් ගණන පිළිබඳ රැස් කරගත් තොරතුරු පහත දැක්වේ.

3, 4, 3, 2, 4, 5, 4, 5, 4, 4
5, 3, 4, 4, 4, 3, 4, 2, 3, 5
4, 4, 3, 5, 4, 4, 3, 4, 5, 3

(i) පහත දැක්වෙන වගුව පිටපත් කරගෙන ඉහත දැක්වූ දත්ත එහි ඇතුළත් කරන්න.


| සමාජිකයන් ගණන | ප්‍රගණන ලකුණු | පවුල් ගණන |
|---|---|---|
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

(ii)  සලකුණින් පවුල් දෙකක් නිරූපණය වනසේ ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක් මඟින් නිරූපණය කරන්න.

(c) (i) තොරතුරු වගු මඟින් හා චිත්‍ර ප්‍රස්තාර මඟින් නිරූපණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න.

(ii) පන්තියේ සිටින සියළුම සිසුන්ගේ පවුල්වල සිටින මුළු සාමාජිකයන් ගණන කීය ද?

(02) (a) ත්‍රිකෝණාකාර තිත් සටහන් මඟින් නිරූපණය කර ඇති සංඛ්‍යා කීපයක් පහත දැක්වේ.



(i) ඉහත රටාවෙන් නිරූපිත සංඛ්‍යා හඳුන්වන නම කුමක් ද?

(ii) එම රටාවේ අටවන සංඛ්‍යාව සොයන්න.

(iii) එම රටාවේ තුන්වන හා හතරවන සංඛ්‍යා එකතු කිරීමෙන් ලැබෙන අගය කීවන සමචතුරස්‍ර සංඛ්‍යාව වේ ද?

(b) (i) 1 සිට 10 තෙක් ඇති ප්‍රථමක සංඛ්‍යා ලියා දක්වන්න.

(ii) 10 දෙපස ඇති සංයුක්ත සංඛ්‍යා දෙක ලියන්න.

(iii) 28 හි කුඩාම සාධකය හා විශාලම සාධකය සොයන්න.

(03) (a) කඩයක තිබූ මිල දර්ශකයකින් කොටසක් පහත දැක්වේ.

| ද්‍රව්‍යය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|
| සහල් | 1kg | 90.00 |
| පරිප්පු | 500g | 130.00 |
| සීනි | 1kg | 80.00 |

සයුමිගේ මව කඩයෙන් මිලදී ගත් ද්‍රව්‍ය
සහල් - 5kg
පරිප්පු - 750g
සීනි - $1\frac{1}{2}$kg

(i) සයුමිගේ මව මිල දී ගත් සියළු ද්‍රව්‍යවල ස්කන්ධය කොපමණ ද?
(ii) මිල දී ගත් ද්‍රව්‍යය සඳහා ගෙවිය යුතු මුදල කොපමණ ද?
(iii) එම මුදල ගෙවීම සඳහා සයුමිගේ මව කඩ හිමියාට ලබාදුන් මුදල රුපියල් 1 000 ක් නම් ඉතිරි ලෙස ලැබුනු මුදල කීය ද?

(b) පුවත් පතක මුද්‍රණය කර තිබූ සංඛ්‍යාවක් කොටුව තුල දැක්වේ.


2360001457

(i) එම සංඛ්‍යාව කලාප වලට වෙන්කර ලියන්න.
(ii) එම සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.

(04) (a) (i) හරය 5 වූ තත්‍ය භාග දෙකක් ලියන්න.
(ii) $\frac{9}{36}$ ට සරලම තුල්‍යය භාගය ලියන්න.
(iii) $\frac{1}{2}, \frac{1}{7}, \frac{1}{4}$ යන භාග ආරෝහණ ක්‍රමයට පිළියෙල කරන්න.


(b) අගය සොයන්න.
(i) $\frac{1}{5} + \frac{3}{10}$ (ii) $\frac{2}{3} - \frac{5}{12}$

(05) (a)




රූපයේ දැක්වෙන එක් එක් කොටුවක දිග 1cm ක් ද පළල 1cm ක් ද වේ.
(i) කුඩාම කොටුවක වර්ගඵලය කොපමණ ද?
(ii) A රූපයේ වර්ගඵලය සොයන්න.
(iii) B රූපයේ වර්ගඵලය සොයන්න.
(iv) A හා B රූපවල වර්ගඵල අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

(b)




(X) (Y)

(i) X හා Y භාජන දෙකේ ඇති ද්‍රව ප්‍රමාණවල එකතුය කොපමණ ද?
(ii) X භාජනයේ ඇති ද්‍රව ප්‍රමාණය Y භාජනයට වඩා කොපමණ වැඩි ද?

(06) (a) (i) $5^3$ යන්නෙහි දර්ශකය හා පාදය වෙන්කර දක්වන්න.

(ii) $5^3$ යන්න කියවන ආකාරය ලියන්න.

(iii) 81, 3 හි බලයක් ලෙස ලියා දක්වන්න.

(iv) $2^3 \times 3^2$ හි අගය සොයන්න.


(b) පහත දී ඇති සංඛ්‍යා නිරීක්ෂණය කරන්න.

275, 302, 457, 900, 408, 115

(i) 2න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

(ii) 5න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

(07) (a) රිෂාඩ්, විනෝදන් හා මලිත් යන අයගේ වයස පහත දී ඇති සංඛ්‍යා රේඛාව මත නිරූපණය කර ඇත.




(i) රිෂාඩ්ගේ වයස අවුරුදු කීයද?

(ii) විනෝදන් මලිත්ට වඩා අවුරුදු කීයකින් වැඩිමහල් ද?

(iii) තරුෂිගේ වයස විනෝදන්ට වඩා අවුරුදු 3ක් අඩුනම්, සංඛ්‍යා රේඛාවක් ඇඳ තරුෂිගේ වයස නිරූපණය කරන්න.

(b) (i) 25 . 37 යන සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න.

(ii) අගය සොයන්න.

3. 28 + 5. 74

(iii) අගය සොයන්න.

7. 23 - 4. 57

To download past papers visit
www.vajirapani.blogspot.com